# පළාත් සභා හා ජනාධිපතිවරණය

## ආසන්න දිනවල පවත්වා කෝටි 200ක් ඉතිරි කර ගන්න

### – මැතිවරණ නිරීක්ෂණ සංවිධාන

■ **ඉන්දික හේවාවිතාරණ**




දේශපාලන පක්ෂවල උනන්දුවක් තිබෙනවා නම් පළාත් සභා මැතිවරණය හා ජනාධිපතිවරණය ආසන්න දිනවල පවත්වා ජනතාවගේ මුදල් රුපියල් කෝටි දෙසියයකට අධික මුදලක් ඉතිරි කර ගැනීමට අවස්ථාව ඇතැයි මැතිවරණ නිරීක්ෂණ සංවිධාන සඳහන් කරයි.

එහෙත් කල් යමින් තිබෙන පළාත් සභා මැතිවරණය පැවැත්වීමට දේශපාලනඥයන්ට හෝ පක්ෂවලට උනන්දුවක් නොමැති බවත්, පළාත් සභා මැතිවරණය පැවැත්වීමට උනන්දුවක් නොමැති වුවද අනිවාර්යයෙන්ම නියමිත කාලවකවානුවලදී ජනාධිපතිවරණය පැවැත්විය යුතු බවත් එම සංවිධාන නියෝජිතයෝ පෙන්වා දෙති.

ඉදිරි ජනාධිපතිවරණයේදී අපේක්ෂකයන් සැලකිය යුතු ප්‍රමාණයක් ඉදිරිපත් විය හැකි බවත්, ඒ හරහා තරගයක් නිර්මාණය වන බවත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය සඳහන් කරයි.

මෙම තරගකාරීත්වය නිසා අතිවිශාල මුදල් ප්‍රමාණයක් වියදම් කර ඡන්ද දායකයන් මුදලට ගැනීමේ තත්ත්වයක් වුව නිර්මාණය විය හැකි බවත්, මේ නිසා මැතිවරණ ප්‍රචාරක වියදම් නීතිය කඩිනමින් රට තුළ ඇති කළ යුතු බවත් එම සංවිධානයේ ජාතික සංවිධායක මංජුල ගජනායක මහතා සඳහන් කළේය.

ඊයේ (14දා) පැවැති මාධ්‍ය සාකච්ඡාවකදී මේ බව කී මංජුල ගජනායක මහතා වැඩිදුරටත් සඳහන් කළේ මෙවර මැතිවරණයේදී අපේක්ෂකයන් වියදම් කරන මුදල් ප්‍රමාණය පිළිබඳ සමස්ත ලංකාවම



ආවරණය වන ආකාරයට සමීක්ෂණයක් කිරීමට සැලසුම් කර තිබෙන බවයි.

එකම දිනයක හෝ ආසන්න දින දෙකක ජනාධිපතිවරණය හා පළාත් සභා මැතිවරණය පැවැත්වීම තුළින් රුපියල් කෝටි දෙසියයක (200) මුදලක් ඉතිරි කරගත හැකි යැයි මැතිවරණ කොමිසම සඳහන් කරන බව පැෆරල් සංවිධානය සඳහන් කරයි.

මේ නිසා කල් යමින් තිබෙන පළාත් සභා මැතිවරණය කඩිනමින් පවත්වාගැනීමට දේශපාලන පක්ෂ උනන්දු විය යුතු බවද එම සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේය.

පළාත් සභා මැතිවරණය කල්දැමීමට කටයුතු කළද පවතින නීතිරීතිවලට අනුව මේ වසරේ දෙසැම්බර් 10 වැනිදාට පෙර ජනාධිපතිවරයෙකු තෝරාගත යුතුව තිබෙන බවත්, මේ නිසා නියමිත කාලයේදීම ජනාධිපතිවරණය පැවැත්වීමට සිදුවන බවත් හෙතෙම පවසා සිටියේය.